# දීගල්ලේ බෝගොඩ වෙද පරපුරෙහි ජලභීතිකා සහ විශේෂ ලය විරේක ප්‍රතිකාරය

පාරම්පරික වෛද්‍ය එච්. එම්. කරුණාරත්න

කුරුණෑගල මාලිගාව ප්‍රදේශයේ දීගල්ලේ කේගොඩ වෙද පරපුර සන්නස් ලබන ලද වෙද පරපුරකි. ජලභීතිකා විශේෂ වෛද්‍යවරයන් වශයෙන් ලියාපදිංචි වී ඇති මෙම පරපුරෙහි වත්මන් උරුමකරුවා එම පරපුරෙහි දහතුන් වන පරම්පරාව යි. ජලභීතිකා රෝගයට මෙන්ම සර්වාංග වෙදකම, දරුවන් ඉපදවීම සහ වැදූගෙයි සන්නියට ප්‍රතිකාර කර මනා පරිචයක් ලබා ඇති මෙම වෙද පරපුර ජලභීතිකා රෝගයට ප්‍රතිකාර කර කිසි දින රෝගියෙකු මිය ගොස් නැති බවට ප්‍රසිද්ධ ය.

සතුන්ගෙන් මිනිසාට බෝ වන රෝග අතරින් ඉතා ම භයානක රෝගය ජලභීතිකා රෝගය යි. දේශීය ජලභීතිකා වෛද්‍ය ක්‍රමයේ ඉතිහාසය බුද්ධ කාලය දක්වා දිවයයි. එදා ආනන්ද මහ රහතන් වහන්සේ නරලොව සත්ත්වයින්ට වියරු බලු විෂයෙන් ඇති වන උවදුරු දිවැසින් දැක ඒ බව ජීවකයින්ට දන්වා එතුමාගෙන් ඊට සුදුසු ඖෂධ හා ප්‍රතිකාර විධි අසා දැන පන්සියයක් මහ රහතන් වහන්සේලාට සහ ඍෂිවරයන් හට කියා දුන් සේක.

බටහිර වෛද්‍ය ක්‍රම සොයා ගැනීමට අවුරුදු දහස් ගණනකට පෙර සිට පෙරදිග ශ්‍රී ලංකාව ඉන්දියාව ආදී රටවල වෛද්‍යවරුන් එදා හඳුන්වා දුන් ඖෂධ ප්‍රතිකාර ක්‍රම, යන්ත්‍ර මන්ත්‍ර ක්‍රම අනුගමනය කරමින් වියරු බලු විෂට සාර්ථකව ප්‍රතිකාර කළ බව සඳහන් වේ. මෙම රෝගය සඳහා බටහිර ප්‍රතිකාර ආරම්භ වූයේ වර්ෂ 1885 ලුවී පාස්චර් මහත්මා ජලභීතිකා එන්නත සොයා ගැනීමෙන් පසුවයි. අපේ දේශීය වෛද්‍යවරු විවිධ ප්‍රතිකාර විධි මෙම රෝගය සඳහා භාවිත කරති. ඇතැම් වෛද්‍යවරු රෝගියාට පිස්සුව සාදවා සුවපත් කරීම සිදු කරති.

## රෝගියා හඳුනා ගැනීම

සාමාන්‍යයෙන් මේ සඳහා සුනඛයාගේ ස්වරූපය විමසීම, සතාගේ හැසිරීම අනුව නිර්ණය කරගෙන තුවාලයට ප්‍රතිකාර කිරීම සිදු කරයි. මීට අමතර ව විශේෂ පරීක්ෂණ දෙකක් සිදු කරනු ලැබේ.රෝගියාගේ දකුණු අතෙහි තල තෙල් හා තල තෙල් ගා මතුරන ලද බුලත් කොළයක් තබනු ලබයි. එවිට බුලත් කොළය පපඩමක් මෙන් පිපී එයි නම් එම පුද්ගලයා ජලභීතිකා රෝගියෙකි.විශේෂිත බෙහෙත් කොළයක් දෙහි ඇඹුලෙන් අඹරා නාභිය වටා ගානු ලබයි. එවිට ඉවසා ගත නොහැකි දැවිල්ලක් හා වේදනාවක් ඇති වෙයි නම් ඔහු ජලභීතිකා රෝගියෙකි. සාමාන්‍ය පුද්ගලයන්ට එසේ දැවිල්ල වේදනාව ඇති නොවෙයි. එසේ වේදනාව ඇති වූ විට එළඟි තෙල් ගා සමනය කරනු ලැබේ.

## සාධ්‍ය අසාධ්‍ය අවස්ථාව නිශ්චය කර ගැනීම

රෝගියා ගින්නට වතුරට සහ සුළඟට බිය වීම අනුව සාධ්‍යාසාධ්‍යතාව නිශ්චය කර ගනී. ඉහත කරුණු වලින් එකකට හෝ දෙකකට පමණක් බිය රෝගියා සාධ්‍යයි. ඉහත කරුණු සියල්ලට ම බිය වීනම් රෝගියා අසාධ්‍ය වේ.

## ප්‍රතිකාර ක්‍රමය

බෙහෙත් ගුලියක් කහ දෙමට ඉස්මෙන් අඹරා පළමුව නස්න කිරීම සිදු කරනු ලැබේ.පපු ප්‍රදේශයේ ඇති විෂ සඳහා ලය විරේක හා බඩ විරේක කිරීම සිදු කරන අතර ලය විරේක සඳහා විළඳවැන්න නැමැති වමන කාරක ඖෂධය ජීවම් කර ඉස්ම එළ කිරි සමග බීමට දෙයි. විෂ විරේචනය සඳහා කොටදිඹුලා කැඳ සහ නිතුල්ල පොතු කැඳ විශේෂ කෙම් ක්‍රමයක් උපයෝගී කර ගෙන පානයට දෙනු ලබයි. විෂ තදබලව ඇති අයට මහ කෂාය හෝ වෙනත් කැඳ පන්තියක් සාදා දෙනු ලැබේ.

### මන්ත්‍ර ශාස්ත්‍ර භාවිතය

භූත බලපෑම ඇති විටමාස තුනට යන්ත්‍ර තුනක් දමනු ලබයි. නියමිත දිනයේ දී මසකට 01 බැගින් යන්ත්‍ර තුනක් දමනු ලබයි.පාරම්පරික වෙදකම සමගම මන්ත්‍ර ශාස්ත්‍රය ද ගුරුවරයාගෙන් ගෝලයාට හිමිවෙයි. මන්ත්‍ර ශාස්ත්‍රයේ නියැළීමට ප්‍රථම මුතුන්මිත්තන්ට, ශාස්ත්‍රයට අධිගෘහිත දෙවිදේවතාවුන්ට පූජා කොට අවසර ගත යුතුය.

"ඕං නමෝ රීරි බිසවුන් වහන්සේත් සෝවල බිසවුන් වහන්සේත් කණ්ඩමාල බිසවුන් වහන්සේත් ...."

යන මන්ත්‍රයෙන් දුම්මල ජීවම් කර යහනට අල්ලා මන්ත්‍ර දිෂ්ඨි කර ගත යුතුය. පසුව පොදුවේ දේවතාවන්ට ආරාධනා කළ යුතුය. තව ද තමාගේ හා නිවසෙහි ආරක්ෂාවට, ආරක්ෂා මන්ත්‍ර භාවිත කළ යුතුය.

### ශරීරය තුළ විෂ ඇත්දැයි සොයා ගැනීම

ෂමානව කපන ලද ගොක් කොළයක් රෝගියාගේ නාභිය කෙළින් ගෙන දිග මැන ගනී. පසුව එය මතුරා දෙවන වර රෝගියාගේ නාභිය කෙළින් ඉන වට මැනීමේ දී ඇඟිළි 4ක පරතරයක් අඩු වී තිබේ නම් ඔහුට ඉනා විෂක් හෝ වෙනත් ජීවම් කරන ලද විෂක් දී තිබේ.

### විශේෂ ලය විරේක ප්‍රතිකාරය

මෙම පාරම්පරික ළය විරේක වෙදකම රටේ ඉතාමත් ප්‍රචලිත වෙදකමකි. මෙය ඉතා පහසු ක්‍රමයකි. ඖෂධ වශයෙන් "විළඳවැන්න" කලං 12ක් පමණ ගෙන කොටා එළකිරි දමා මිරිකා හත්වරක් පෙරා (හත් අඩියට පෙරා)ජීවම් කර (දැහැන් හතකින් මතුරා) රෝගියාට හිස් බඩට බොන්නට දෙයි.වස විස ශරීරගත වීම්, ඉනා බන්ධන කාලාන්තරයක් තිස්සේ ශරීරගත වී ඇති විෂ (ගර විෂ) හා ජංගම විෂ වලට ද භාවිත කරයි. මීට අමතර ව පූර්ව කර්ම සිදු කරයි. එසේ ම අති වමනය සහ ආබාධ සඳහා ද අවශ්‍ය විට දී ප්‍රතිකාර කරනු ලැබේ. වමනය සමග කහ පාටට පිත යන විට වමනය නිසි පරිදි සිදු වූ බව හඳුනා ගනී.